# ශාන්ත ජෝන් ගිලන් රථ සේවය

# කිටී සාමාජික නිළ ලාංඡන පැළඳ වීම

# KITTY – 2023




**මහාමායා බාලිකා විද්‍යාලය - ප්‍රාථමික අංශය**


කේ.චාමිනී පල්ලියගුරු

# ආදර්ශ ව්‍යාපෘතිය

## කතෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය -2023 දෙසැම්බර්

සෝදුපත් සැකසීම- කේ.සී. පල්ලියගුරු

පරිගණක පිටු සැකසීම- එල්.ඒ.ටී.පී. ලියන්දෙනිය

ISBN 978-624-208-016-1

# කතෘගේ ප්‍රකාශය

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය යටතේ පාසල් දරුවන්ට ආදර්ශයක් සැපයීම පිණිස මෙම ව්‍යාපෘති වාර්තාව ග්‍රන්ථයක් කරන බව ප්‍රකාශ කරමි.

*කේ.සී. පල්ලියගුරු*

# පිදුම

ගුරු කුලකයේ

සියලු ගුරු සහෝදර සහෝදරියන්ට

සෙනෙහසින්

පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර (විදුහල්පතිනිය)

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023. 10.20

# හැඳින්වීම

ශාන්ත ජෝන් ගිලන් සේවා හමුදාවේ ලාබාලතම සාමාජිකයින් වන බැජර් (කිටී) යනුවෙන් හඳුන්වන ලබන අතර එක්සත් රාජධානියේදී මෙය ආරම්භ කරන ලද්දේ 1987 වසරේදී හමුදා සංවත්සරය සැමරීම සඳහා ය.

කිටියන් සතියකට වරක් රැස්වන අතර නායකයින් මාර්ගයෙන් ප්‍රදේශයේ කිටියන් පවත්වන වෙනත් කිටී කණ්ඩායම් සමඟ සම්බන්ධතා පවත්වයි. එක් එක් ලාංඡන සඳහා මාතෘකා 4 බැගින් වන ලාංඡන 9ක් ඇතුළත් වන අතර ඔවුන් සම්පූර්ණ කරන සෑම පාඨමාලාවන් සඳහාම නිල ඇඳුමට පැළඳිය හැකි ලාංඡනයක් සහ ගැළපෙන සහතිකයක් ප්‍රධානය කරනු ලැබේ.

ඒ අනුව මහාමායා බාලිකා විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ 2 ශ්‍රේණිය දරුවන් ශාන්ත ජෝන් ගිලන් සේවයේ නව කිටී සාමාජිකාවන් ලෙස පත්වීමෙන් අනතුරුව කිටී නිල ලාංඡන පැළැන්ඳවීමේ උත්සවය 2023.09.19 වන දින මහාමායා බාලිකා විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි.

# <u>කිරි ව්‍යාපාරයේ අරමුණු</u>

01. නිදහස් පරිසරයක් තුළ ඔවුන් කරන සෑම දෙයකින්ම සෑහීමට පත්වන පරිදි ඉගෙනීමට හා විනෝදවීමට හැකි අවස්ථාවක් ලබා දීම .

02. දරුවන් කුඩාකල සිටම ශාන්ත ජෝන් ගිලන් සේවයේ සංකල්පය තේරුම් ගෙන මූලික ප්‍රථමාධාර සහ සාමූහික ක්‍රියාකාරකම් සඳහා දරුවන් සාර්ථකව එකතුකර ගැනීම.

03. සාමාන්‍ය දැනීම, අවංකභාවය, ස්වයං පාලනය, උද්යෝගය සහ සාධාරණත්වය පිළිබඳ හැඟීම් වර්ධනය කර ගැනීමට කිරියන් දිරිගැන්වීම.

04. ව්‍යාපාරය හා බැඳුණු කණිෂ්ඨ කණ්ඩායමක් සකස් කිරීම සහ ළමයින් කැඩෙට්වරුන්ගේ තත්ත්වය දක්වා සංවර්ධනය කිරීම.

# යොදා ගත් සම්පත්

***භෞතික සම්පත්***

- සැරසිලි සඳහා උණබට
- උණ කොළ
- මල්
- කොහු ලණු
- මැටි පහන්

***මානව සම්පත්***

- විදුහල්පතිනිය ශශිකලා සේනාධීර මහත්මිය
- නියෝජ්‍ය විදුහල්පතිනිය හිමාලි සේනාධීර මහත්මිය
- ප්‍රාථමික අංශයේ සහකාර විදුහල්පතිනිය සුසිතා අල්විස් මහත්මිය
- ප්‍රාථමික අංශයේ සියළුම ගුරු මහත්මීන්
- ප්‍රධාන කොමසාරිස් ශාන්ත ජෝන් ගිලන් රථ හමුදාව සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහල වෛද්‍ය ජේ.එම්. නිලාම් මැතිතුමා
- පළාත් කොමසාරිස් ශාන්ත ජෝන් ගිලන් රථ හමුදාව වෛද්‍ය පී.එම්.ඒ. සමරක්කොඩි මහතා
- දිස්ත්‍රික් කොමසාරිස් ශාන්ත ජෝන් ගිලන් රථ හමුදාව අමල් බණ්ඩාර දස්කොන් මහතා
- සහකාර දිස්ත්‍රික් කොමසාරිස් ශාන්ත ජෝන් ගිලන් රථ හමුදාව මධ්‍යම පළාත් පරිපාලන ලේකම් අජිත් දිසානායක මහතා
- සේනාංක අධිකාරිනි ශාන්ත ජෝන් ගිලන් රථ හමුදාව මිහිරි කොබේවත්ත මිය
- සේනාංක අධිකාරිනි ශාන්ත ජෝන් ගිලන් රථ හමුදාව සිරිමා අබේරත්න මිය
- කොට්ඨාශ අධිකාරිනි ශාන්ත ජෝන් ගිලන් රථ හමුදාව අයේෂා වීරසිංහ මිය
- කිරි දරු දැරියන් සහ ඔවුන්ගේ දෙමව්පියන්
- අනධ්‍යන කාර්යය මණ්ඩලය

# <u>ක්‍රියාත්මක කළ ආකාරය</u>

මහාමායා බාලිකා විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ සහකාර විදුහල්පතිනිය විසින් පාසලේ කිරි සාමාජික කණ්ඩායමක් ආරම්භ කිරීමට අප හට අවසර ලබා දීමෙන් පසු එය ඉදිරියට පවත්වාගෙන යා යුතු ආකාරය පිළිබඳ උපදෙස් ලබා දෙන ලදි.

ඉන් අනතුරුව 2023.07.21 2 ශ්‍රේණිය සිසුවියන්ගේ දෙමාපිය රැස්වීමේ දී ශාන්ත ජෝන් ගිලන් සේවයේ මධ්‍යම පළාත් සහකාර දිස්ත්‍රික් ලේකම් අජිත් දිසානායක මහතාගේ කෙටි දේශනයෙන් පසු දෙමාපියන් දැනුවත් කර දෙමාපිය කැමැත්ත සඳහා අවසර ලිපි ලබා ගන්නා ලදි.

ඉන් අනතුරුව නිල ඇඳුම් හා නිල ලාංඡන සකස් කර ගැනීම සිදු කරන ලදි. සතියේ සෑම සඳුදා දිනයක ම දහවල් 12.00 සිට 1.00 දක්වා කිරි පුහුණුවීම් කටයුතු පවත්වන ලදි. කිරි සාමාජිකාවන් සඳහා නිලලාංඡන පැවැත්වීම විදුහල්පතිනියගේ උපදෙස් මත 2023.09.19 වන දින සිදු කිරීමට උත්සව කටයුතු සංවිධානය කරන ලදි.

දෙමාපියන්ගේ සහයෝගය මත ප්‍රධාන ශාලාවේ සැරසිලි කිරීම, ශබ්ද විකාශන යන්ත්‍ර සපයා ගැනීම, සමරු තිළිණ සකස් කර ගැනීම, සංග්‍රහ කටයුතු සූදානම් කර ගැනීම යනාදී කාර්යයන් රාශියක් සිදු කරන ලදී.

පාසලේ ආචාර්ය මණ්ඩලයේ පූර්ණ සහයෝගය සහිත ව උත්සවයේ අංග පෙළ ගැස්ම , නර්තන පුහුණුවීම් , බටහිර තූර්ය වාදන කණ්ඩායම් පුහුණුවීම්, නිවේදන කටයුතු පුහුණුවීම් යනාදී සියලු කටයුතු සිදුකරන ලදි.

මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමියට, ශාන්ත ජෝන් ගිලන්රථ හමුදාවේ ප්‍රධාන කොමසාරිස්තුමාට, පළාත් කොමසාරිස්වරුන්ට උත්සවය සඳහා ආරාධනා කරන ලදි.

2023.09.19 වන දින උදෑසන 9.00ට ප්‍රධාන ආරාධිත අමුත්තන් පිළිගැනීම හා ජාතික ධජ එසවීමෙන් අනතුරුව ප්‍රධාන ශාලාවට කැඳවාගෙන විත් අසුන් ගන්වන ලදි. ඉන් අනතුරුව උත්සවයේ කටයුතු ආරම්භ කරන ලදි.

මෙහි දී,

- මහාමායා බාලිකා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිතුමිය හිමාලි සේනාධීර මහත්මියගේ හා ප්‍රධාන කොමසාරිස්තුමාගේ අතින් කිටී ලාංඡනය නිරාවරණය කිරීම.
- කිටී සාමාජිකාවන්ට දෙමාපියන් විසින් නිල ලාංඡන පැළැන්ඳවීම හා දිවුරුම් දීම.
- කිටී සාමාජික සහතික පත්‍ර ප්‍රදානය කිරීම.
- ප්‍රධාන කොමසාරිස්තුමා විසින් කෙටි දේශනයක් පැවැත්වීම.
- ආරාධිත අමුත්තන් සඳහා සමරු තිළිණ පිළිගැන්වීම
- සහකාර විදුහල්පති තුමියගේ ස්තුති කතාව

යන විශේෂ අවස්ථා උත්සවය පුරාවට දක්නට ලැබුණි.

උත්සවය අවසානයේ නවක කිටී සාමාජිකාවන් හා විදුහල්පතිතුමිය සහකාර විදුහල්පතිතුමිය ප්‍රධාන කොමසාරිස්තුමා සහකාර කොමසාරිස්තුමා සහ කොට්ඨාශ භාර නිලධාරිතුමියන් හා සමූහ ඡායාරූපය ලබාගැනීම සිදුකරන ලදි.

ඉන්පසු පුධාන ආරාධිත අමුත්තන් සඳහා වූ කෙටි සංග්‍රහය භුක්ති විඳීමෙන් පසු උත්සවයේ කටයුතු අවසන් කරන ලදි.

***විශේෂ කරුණු - :***

- උත්සවයේ විවිධ වගකීම් 2 ශ්‍රේණියේ දෙමාපියන් වෙත පන්ති වශයෙන් බෙදා දීම.
- උත්සවයේ ප්‍රධාන අංග ගුරු මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදු කිරීම.

සිදුකරන ලදි.

# කාල රාමුව

| ක්‍රියාකාරකම | ජූලි | | | | අගෝස්තු | | | | සැප්තැම්බර් | | | | ඔක්තෝබර් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ව්‍යාපෘතිය සම්බන්ධ ව විදුහල්පතිනිය සමඟ සාකච්ජා කිරීම. | | | | | | | | | | | | | | | | |
| ව්‍යාපෘතිය සඳහා දෙමාපිය කැමැත්ත ලබා ගැනීම. | | | | | | | | | | | | | | | | |
| ව්‍යාපෘතිය ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීම. | | | | | | | | | | | | | | | | |
| නිල ලාංජන පැළඳ වීමේ උත්සවය ක්‍රියාත්මක කිරීම. | | | | | | | | | | | | | | | | |
| ව්‍යාපෘති වාර්තාව සකස් කොට භාර දීම. | | | | | | | | | | | | | | | | |

## <u>මතුවූ ගැටළු</u>

1. කිට් කණ්ඩායම් සාමාජිකත්වය ලබා ගත් සිසුවියන් සිව් දෙනෙකු නිල ලාංඡන පැළැන්දවීමේ උත්සවයට පෙර ඉන් ඉවත් වීම.

2. පාසලේ ශබ්ද විකාශන යන්ත්‍රවල දෝෂ පැවැති නිසාවෙන් ශබ්ද විකාශන යන්ත්‍ර කුලී පදනම මත ලබා ගැනීමට සිදුවීම.

3. නිල ඇඳුම් සැකසීමේ නියමිත ප්‍රමිතිය මසා නොතිබූ ඇඳුම් කිහිපයක් නැවත සකස් කිරීම් සිදු කිරීම.

## වියාපෘතිය සඳහා වියදම්

- දෙමව්පියන් විසින් ව්‍යාපෘතිය සඳහා වූ වියදම් කැමැත්තෙන් දරන ලදී.
- සිසුවියන් සඳහා බැජ් හා සහතිකපත් සඳහා එක් දරුවෙකුට රුපියල් 360/=ක මුදලක් වැය විය.
- කිට් නිල ඇඳුම් - (සුදු අත් දිග කමිසය සහිත) සම්පූර්ණ නිල ඇඳුම සඳහා එක් දරුවෙක් රුපියල් 4300/= ක මුදලක් බැගින් වැය කරන ලදී.
- සුදු කමිසය ඇති දරුවන් නිල ඇඳුම සඳහා රුපියල් 2900/= මුදලක් වැය කරන ලදී.
- මීට අමතරව උත්සවයේ ආරාධිත අමුත්තන් සඳහා සියලු සංග්‍රහ කටයුතු 2 ශ්‍රේණිය පන්ති පහේ ම කිට් සාමාජික දරුවන්ගේ දෙමව්පියන් විසින් දරන ලදී.
- ආරාධිත අමුත්තන් සඳහා පිළිගැන්වීමට සකස් කරන ලද සමරු තිලිණ, කිට් මුද්‍රණ පෝස්ටර් හා සැරසිලි සඳහා 2 ශ්‍රේණිය D පන්තියෙහි වෙනුති දියණියගේ මවගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් සිදු කරන ලදී.

# ඇමුණුම්


MAYANZ PHOTOGRAPHY
St. John Ambulance Kitty programme
Photographed by: Thisumi Thoradeniya


MAYANZ PHOTOGRAPHY
St. John Ambulance Kitty programme
Photographed by: Thisumi Thoradeniya


MAYANZ PHOTOGRAPHY
St. John Ambulance Kitty programme
Photographed by: Thisumi Thoradeniya


MAYANZ PHOTOGRAPHY
St. John Ambulance Kitty programme
Photographed by: Thisumi Thoradeniya


නිල ලාංඡන පැළඳවීමේ
MAYANZ PHOTOGRAPHY
St. John Ambulance Kitty programme
Photographed by: Thisumi Thoradeniya


නිල ලාංඡන පැළඳවීමේ උළෙල
MAYANZ PHOTOGRAPHY
St. John Ambulance Kitty programme
Photographed by: Thisumi Thoradeniya

# <u>ස්තූතිය</u>

මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට මා හට
සහාය ලබා දුන් සියලු දෙනාට ද
මෙම කෘතිය සම්පාදන උදෙසා
නිරන්තරයෙන් උපදෙස් හා අවශ්‍ය
මඟපෙන්වීම් සිදු කළ සියලු දෙනා
වෙත ද
හද පිරි ස්තූතිය
පුද කරමි.

*K.චාමිනී පල්ලියගුරු*

*(Dip. N.C.O.E.)*

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023-10-20

**ISBN 978-624-208-016-1**